**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදි උපාධි පාඨමාලාව - 5 වන මට්ටම**

**LLU5709 පරිපාලන නීතිය**

**අවසාන පරීක්ෂණය - 2020/2021**

**කාලය - පැය තුනයි (03)**

-----------------------------------------------------------------------------------------------

**දිනය - 2021 සැප්තැම්බර් 15 වේලාව - පෙ.ව. 9.30 - ප.ව. 12.30**

-----------------------------------------------------------------------------------------------

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු විසි පහක් (25) හිමි වේ.**

1. 2002 අංක 40 දරණ මැසිටෝනියාවේ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද මහජන උපයෝගිතා කොමිෂන් සභාවට විදුලි බල කර්මාන්තයේ ආර්ථික, තාක්ෂණික සහ ආරක්ෂක නියාමකයා ලෙස කටයුතු කිරීමටත්, මැසිටෝනියාවේ විදුලි සැපයුම් සේවා සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ විදුලි උත්පාදනයෙන් ඇති විය හැකි අනතුරු වලින් මහජනතාව ආරක්ෂා කිරීමටත් විදුලි බල සැපයුම් සේවාව පිළිබඳ විශ්වසනීයත්වය ඇති කිරීම සඳහාත් බලය ඇත.පනතේ 12වන වගන්තියේ සඳහන් වන්නේ නව විදුලි ව්‍යාපෘතියක් සඳහා අයදුම්පතක් ලැබුණු පසු, කොමිෂන් සභාව එයට අනුමැතිය ලබා දීමට අදහස් කරන්නේ නම් නව විදුලි ව්‍යාපෘතියෙන් පීඩාවට පත්වීමට ඉඩ ඇති පුද්ගලයන්ගේ අවධානයට යොමු කිරීම සුදුසු යැයි සලකන පරිදි, තමා එසේ අනුමැතිය දීමට අදහස් කරන බවට වන දැන්වීමක් ප්‍රකාශයට පත්කළ යුතු බවයි. 12(අ) වගන්තියේ තවදුරටත් සඳහන් වන්නේ මෙම දැන්වීම භාෂා තුනෙන්ම පල කලයුතු බවයි.

"පාක් වීව්" හෝටලයට විදුලිය සැපයීම සඳහා කටුවල පාරේ වම්පසින් අධි බලැති විදුලි රැහැනක් සවි කිරීම සඳහා වූ නව විදුලි ව්‍යාපෘතියකට කොමිෂම අනුමැතිය ලබා දුන්නේය. විමල්, රාජේන්ද්‍ර සහ නාමල් කටුවල පාරේ වම් පස පිහිටි දේපල වල හිමිකරුවන්ය. පනතේ 14වන වගන්තිය යටතේ ඔවුන් කොමිෂමට පෙත්සමක් ඉදිරිපත් කල අතර යෝජිත විදුලි සැපයුම් ව්‍යාපෘතිය පිළිබඳව තමන් කිසිවක් නොදන්නා බවත්, අකුණු අනතුරු සහ පිළිකා රෝග ඇතුළු බරපතල සෞඛ්‍ය අවදානමකට මුහුණ පෑමට සිදුවන බැවින් මේ මගින් ඉතා භයානක තත්ත්වයකට තමන් නිරාවරණය වන බවත් කියා සිටියහ.

කොමිෂම වෙත ලැබෙන ඕනෑම පෙත්සමක් සම්බන්ධයෙන් සති හයක කාලයක් තුලදී පරීක්ෂණයක් පැවැත්වීම පනතේ 15 වන වගන්තිය මගින් අනිවාර්ය කර ඇත. තවද පනතේ

4 වන වගන්තිය මඟින් දැක්වෙන්නේ වීදියක හෝ ඊට ඉහළින් විදුලි රැහැන් ඇදීම සඳහා කොමිෂම විසින් අදාල ප්‍රාදේශිය සභාවෙන් අවසර ලබාගත යුතු වීම අනිවාර්ය බවයි. පනතේ 5 වන වගන්තියේ සඳහන් වන්නේ කොමිෂම විසින් යෝජිත විදුලි ව්‍යාපෘතිය සඳහා විකල්ප මාර්ගයක් පිළිබඳව වන තාක්ෂණික වාර්තාවක් අතිරේක ලියවිල්ලක් වශයෙන් ප්‍රාදේශීය සභාවට කරන ලබන ඉල්ලීම සමඟ ඉදිරිපත් කලහැකි බවයි.

කටුවල පාරේ දකුණු පැත්තේ දේපල හිමි තෝරාගත් කිහිප දෙනෙකුගේ සහභාගිත්වයෙන් කොමිෂම විසින් පරීක්ෂණක් පැවැත් වූ බව තමාට දැනගන්නට ලැබුණු බව ඔවුහු කියා සිටියහ. තවද කොමිෂම තාක්ෂණික වාර්තාවක් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් නොකර ඉහත තීරණයට පැමිණ ඇත.

ඉහත සිදුවීම මත පදනම්ව පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) මෙම ප්‍රශ්නයට අදාල නීතිමය ගැටළු හඳුනාගන්න. (ලකුණු 15)

(ආ) පීඩාවට පත් පාර්ශවයන්ට සුදුසු ප්‍රතිකර්ම පිළිබඳව උපදෙස් දෙන්න. (ලකුණු 10)

ඔබේ පිළිතුර අදාල නෛතික ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරින් තහවුරු කළ යුතුය.

2. 1978 අංක 15 දරණ ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38 (අ) වගන්තියට අනුව අමාත්‍යවරයාට ඕනෑම අවස්ථාවක, ඕනෑම හදිසි හෝ පොදු අරමුණක් සඳහා ඕනෑම ඉඩමක් අත්පත් කරගැනීමට අවශ්‍ය වන්නේනම්, පනතේ 2 වන වගන්තියට අනුව එම ඉඩම් පිහිටි ප්‍රදේශයේ නිවේදනයක් ප්‍රදර්ශනය කිරීමෙන් අනතුරුව අත්පත් කරගැනීමේ නියෝගයක් නිකුත් කළ හැකිය. පවරාගත් ඉඩම කිසිදු පොදු අරමුණක් සඳහා ප්‍රයෝජනයට නොගත්තේ නම් 39(1) වගන්තියට අනුව, පසුව ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද නියෝගයක් මඟින් එම පවරාගැනීමේ නියෝගය අවලංගු කිරීමට අමාත්‍යවරයාට හැකිය.

2015දී බණ්ඩාරට අයත් අක්කර 19ක ඉඩමක් අත්පත් කර ගැනීමට අමාත්‍යවරයා නියෝගයක් ලබාදුන්නේ නගරයේ වාණිජ කටයුතු සඳහා නිසි පහසුකම් නොමැතිකම හේතුවෙන් නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට තීරණය කර ඇති බව දන්වමිනි. අනුමත නගර සංවර්ධන සැලසුමට අනුව සාප්පු සංකීර්ණය ඉදි කිරීම සඳහා අවශ්‍ය මුළු භූමි ප්‍රමාණය පර්චස් 35ක් පමණක් බව බණ්ඩාර සොයා ගත්තේය. තවද 2015 සිට 2020 කාලය තුලදී ඉතිරි වූ ඉඩම් වලින් අක්කර 18කට වැඩි ප්‍රමාණයක් කිසිදු පොදු අරමුණක් සඳහා භාවිතා කර නොමැත. සාප්පු සංකීර්ණය සඳහා ඇත්ත වශයෙන්ම අවශ්‍ය කරන ඉඩම් ප්‍රමාණය පමණක් රඳවා තබාගන්නා ලෙස නියෝගයක් නිකුත් කරන

ලෙස 2021 ජනවාරි මාසයේදී බණ්ඩාර අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටියේය. මාසයක් ඇතුලත මෙම ගැටළුව විසඳන බවට අමාත්‍යවරයා පොරොන්දු වී තිබුණි. කෙසේ වෙතත් මෙම ගැටළුව විසදීම සඳහා මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොමැත.

අමාත්‍යවරයාට එරෙහිව යම් නීතිමය පියවරක් ගත හැකිද යන්න පිළිබඳව බණ්ඩාර ඔබගෙන් උපදෙස් පතයි.

බණ්ඩාරට උපදෙස් දෙන්න.

අදාල අධිකාරීන් මඟින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

3. පාරිභෝගික ආරක්ෂණ අධිකාරියේ කොමසාරිස්වරයාට අනෙකුත් කරුණු අතර, නිෂ්පාදකයින්ට හෝ වෙළඳුන්ට පාරිභෝගික භාණ්ඩවල උපරිම මිල ගණන් සම්බන්ධයෙන් වන පොදු සහ නිශ්චිත උපදෙස් නිකුත් කිරීමේ බලය පැවරේ. ඕනෑම පැමිණිල්ලක් ලිඛිතව ලැබීමෙන් හෝ ඔහුගේම යෝජනාව මත පරීක්ෂණයන් පැවැත්වීමේ බලයද ඔහුට ඇත. රටේ පවතින තත්ත්වය සලකා බලා 2021 මැයි මාසයේදී සහල් සඳහා උපරිම තොග මිලක් නියම කරමින් කොමසාරිස්වරයා විසින් නිශ්චිත නියෝගයක් නිකුත් කළේය. KK සහල් මෝලට එරෙහිව කොමසාරිස්වරයාට පැමිණිලි රාශියක් ලැබිණි. මෙම සහල් මෝලෙහි හිමිකරු වන සිල්වා නිශ්චිත මිලට සහල් විකිණීම ප්‍රතික්ෂේප කළ බවත් ඔහුගේ නිශ්පාදනයන්හි ගුණාත්මකභාවය ඉතා අඩු බවත් නිශ්පාදකයෙක් සහ තොග වෙළෙන්දෙක් චෝදනා කළේය. පසුව, කොමසාරිස්වරයා මේ පිළිබඳ සොයා බැලීමට කමිටුවක් පත් කළේය. එම කමිටුව සහකාර කොමසාරිස්වරයාගෙන් සහ අධිකාරියේ ජ්‍යෝෂ්ඨ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය. කමිටුව 2021 ජුලි 15වන දින මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළ අතර මෙම චෝදනා දෙක පදනම් කර ගනිමින් චෝදනා පත්‍රයක් නිකුත් කළේය. 2021 ජුලි 12 වන දින සිල්වාට චෝදනා පත්‍රය ලැබුණු අතර එදින ඔහුගේ මව රෝහලට ඇතුලත් කළ හෙයින් පරීක්ෂණය කල් දමන ලෙස ඔහු ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, කමිටුව ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. කමිටුව සිල්වාට එරෙහිව චෝදනා කළ අයගෙන් සාක්ෂි කැඳවූ නමුත් නීතිඥ සහාය ලබා ගැනීමට ඔහු කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. ඔහු ගොවීන්ගෙන් කිලෝග්‍රෑමයක් රුපියල් 30කට මිලදී ගත් බවත් එය අධිකාරිය විසින් නියම කරන ලද අවම මිලදී ගැනීමේ මිලටත් වඩා අඩු බවටත් කමිටුව චෝදනා කළේය. පරීක්ෂණය පැවැත්වුණ දිනයේදි එය ආරම්භ වීමට පෙර, ප්‍රසිද්ධ “කළණි” සහල් මෝලෙහි හිමිකරු වන රුවන් සහකාර කොමසාරිස්වරයා සමඟ ඔහුගේ කාමරය තුල සාකච්ඡා කරමින් සිටින බව සිල්වා දුටුවේය. පරීක්ෂණය පැයක කාලයක් පැවැති අතර කමිටුව සිය තීරණය කොමසාරිස්වරයා වෙත යොමු කළේය. කමිටුවේ සොයා ගැනීම් මත පදනම්ව කොමසාරිස්වරයා සිල්වාගේ තොග වෙළඳ බලපත්‍රය වසරකට අත්හිටුවා ඇත.

කොමසාරිස්වරයාගේ තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන සිල්වා කොමසාරිස්වරයාගේ තීරණය අභියෝගයට ලක් කල හැකිද යන්න පිළිබඳව ඔබගෙන් විමසීමක් කරයි.

සිල්වාට උපදෙස් දෙන්න.

අදාල අධිකාරින් මඟින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

4. නිව්ලැන්ඩ්හි ජාතික වරාය අධිකාරී පනත මඟින් වරාය අධිකාරියේ සේවකයන්ගේ උසස්වීම්, ස්ථාන මාරුවීම් සහ විනය කටයුතු සම්බන්ධව රෙගුලාසි පැනවීමට ජාතික වරාය අධිකාරියට බලය පවරයි. අධිකාරියේ තීරණය පිළිබඳව සෑහිමකට පත් නොවන පාර්ශවයන්ට අධිකාරියේ තීරණය ප්‍රකාශයට පත්කළ දින සිට මාසයක කාලයක් තුල පරිපාලන අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව පනතේ 30 වන වගන්තියේ සඳහන් වේ. පනතේ 40වන වගන්තියේ සඳහන් වන්නේ උසස්වීම් වලට අදාල සියලුම අයදුම්පත් පනතේ 1 වන උපලේඛනයේ දක්වා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් මත පදනම් විය යුතු බවයි. පනත තව දුරටත් දක්වා ඇත්තේ ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කරන ඕනෑම අයෙකුට දිවයිනේ ඕනෑම ස්ථානයක් මත පදනම්ව එම ඉල්ලීම කලහැකි බවයි. 2021 අගෝස්තු 1 වන දින සිට බල පැවැත්වෙන පරිදි අධිකාරිය පහත සඳහන් රෙගුලාසි නිකුත් කර ඇත.

(අ) සියලුම අනාගත අභියාචනා විෂයභාර අමාත්‍යවරයාට වහාම ඉදිරිපත් කල යුතු අතර, අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වේ.

(ලකුණු 10)

(ආ) සියලුම අයදුම්කරුවන් සිය උසස්වීම් සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සමඟ වෘත්තීය සුදුසුකම් වල සහතික කළ පිටපත්ද ඇතුලත් කළ යුතුය.

(ලකුණු 10)

(ඇ) ස්ථාන මාරුවීම් සඳහා වන අනාගත අයදුම්පත් ඒ ඒ පළාත් වලට සීමා කෙරේ.

(ලකුණු 05)

ඉහත රෙගුලාසිවල වලංගුතාවය පිළිබඳව සාකච්ඡා කරන්න.

අදාල අධිකාරීන් මඟින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

5. 2005 අංක 20 දරණ ජාතික සෞඛ්‍ය පනත මඟින් ජාතික සෞඛ්‍ය විශේෂඥ ඒකකයක්, (NHEU) පත්කිරීමට අමාත්‍යවරයාට බලය ලැබේ. මෙරට ඖෂධ ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම සහ සැපයීම නියාමනය කිරීමේ බලය මෙම ඒකකයට ඇත. පනතේ 35 වන වගන්තියේ සඳහන් වන්නේ පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන ජාතික ඖෂධ කාර්යාංශයෙන් අනුමැතිය ලබාගැනීමෙන් පසුව පමණක් ඖෂධ ආනයනය කිරීම සඳහා බලපත්‍ර

නිකුත් කිරීමට NHEU ට බලය පැවරී ඇති බවයි. පනතේ 50 වන වගන්තිය මඟින් දක්වා ඇත්තේ NHEU හි තීරණය අවසාන හා තීරණාත්මක බවත් එය කිසිදු අධිකරණයකදී අභියෝග කළ නොහැකි බවත්ය.

අත්‍යාවශ්‍ය ඖෂධ ආනයනය සඳහා ලියාපදිංචි ආනයනකරුවෙකු වන ජයමාන්න තයිරොක්සින් පෙති ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අයදුම්පතක් ඉදිරිපත් කළේය. කෙසේ වෙතත් ඖෂධ කාර්යාංශයේ අනුමැතිය ලබා නොගෙන, තයිරොක්සින් පෙති අත්‍යාවශ්‍ය ඖෂධයක් ලෙස වර්ගීකරණය කළ නොහැකි බව පවසමින් NHEU එම අයදුම්පත ප්‍රතික්ෂේප කළේය. මෙම තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පසුව, ඔහු විසින් ආනයනය කරන ලද ප්‍රමාණයේ මුළු වටිනාකමින් 15% අතිරේක බද්දක් ගෙවිය යුතු බවට වන කොන්දේසිය යටතේ එම ඖෂධයේම වෙනත් වෙළඳ නාමයක් යටතේ ඖෂධ ආනයනය කිරීමට බලපත්‍රයක් නිකුත් කිරීමට NHEU එකඟ විය. තම තීරණයට හේතු දැක්වීම NHEU ප්‍රතික්ෂේප කළේය.

NHEU තීරණයට එරෙහිව අධිකරණයක් ඉදිරියේ අභියෝග කිරීමට හැකිදැයි ජයමාන්න ඔබගෙන් විමසයි.

1972 අංක 18 දරණ අර්ථ නිරූපණ (සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලද අර්ථ නිරූපණ ආඥා පනතේ විධිවිධාන පිළිබඳව විශේෂයෙන් සඳහන් කර ඔහුට උපදෙස් දෙන්න.

***හිමිකම් ඇවිරිණි***